# සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
# சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
# Department of Samurdhi Development

මුදල් අමාත්‍යාංශය
සමෘද්ධි , ගෘහ ආර්ථික , ක්ෂුද්‍ර මූල්‍ය , ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය
நிதி அமைச்சு
சமுர்த்தி, வதிவிடப் பொருளாதார,நுண்நிதிய, சுயதொழில்,மற்றும் வியாபார அபிவிருத்தி இராஜாங்க அமைச்சு
Ministry of Finance
State Ministry of Samurdhi, Household Economy, Micro Finance, Self Employment and Business Development


මගේ අංකය / எனது இல / My No: DSD/HO/05/MF/07/MS/ACP
ඔබේ අංකය / உமது இல / Your No: ..........................................
දිනය / திகதி / Date: 2022.02.15

දිස්ත්‍රික් ලේකම් / දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්
දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ
ප්‍රාදේශිය ලේකම්
සමෘද්ධි නියෝජ්‍ය අධ්‍යක්ෂ
සහකාර අධ්‍යක්ෂ
සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිති හා බැංකු කළමණාකරුවන් වෙත.

## සමෘද්ධි ප්‍රජාමූල බැංකු හා බැංකු සමිති ක්‍රියාකාරි සැලැස්ම සකස් කිරිම - 2022 වර්ෂය.

සමෘද්ධි (දිවිනැගුම ) පනත ප්‍රකාරව දිවිනැගුම ප්‍රජාමූල බැංකු කටයුතු සාර්ථක ලෙස **මෙහෙයවීම සඳහා ප්‍රාදේශීය ආයතනයක්** ලෙස සමෘද්ධි ප්‍රජා මූල බැංකු සමිති කටයුතු කල යුතු බව (පනතේ 32 ඇ) දක්වා ඇත.

ඒ අනුව සමස්ථ සමෘද්ධි බැංකු ජාලයේ කටයුතු මෙහෙයවමින් යහපත් ක්ෂුද්‍ර මූල්‍ය ජාලයක් ඇති කිරිමේ වගකීම සමෘද්ධි පනතේ වගන්ති මගින්ම, සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිතියට පවරා ඇත.

මෙම අරමුණු සාක්ෂාත් කර ගැනීම පෙරදැරිව 2022 වර්ෂයට අදාලව ක්‍රියාකාරි සැලැස්මක් සකසා ඒ අනුව කටයුතු මෙහෙයවීම හා ප්‍රගති සමාලෝචනයන් පැවැත්වීම සමෘද්ධි බැංකු සමිති කළමණාකරුවන් ඇතුළු කාර්යය මණ්ඩලයේ වගකීම වේ.

ක්‍රියාකාරි සැලැස්මක් සැකසීමට අදාල ආදර්ශ ආකෘතින් මේ සමඟ යොමු කර ඇති අතර ප්‍රදේශයට ගැලපෙන හා ප්‍රාදේශිය වැඩසටහන් අනුව එහි සංශෝධනයන් කර සුදුසු පරිදි බැංකු සමිතියට අදාල ක්‍රියාකාරි සැලැස්ම සකසා ගත හැක.

කෙසේ නමුත් සමෘද්ධි බැංකු වලට අදාල ඉලක්ක පිහිටුවා ගැනීම, ක්‍රියාකාරි සැලැස්ම සැකසීම වැනි කරුණු සමෘද්ධි බැංකු කාර්යය මණ්ඩලය හා සාකච්ඡා කර සකස් කල යුතුවේ. ඒ අනුව සමෘද්ධි බැංකුවේ කාර්ය මණ්ඩලයේද සහය ඇතිව සමෘද්ධි බැංකුවේ ක්‍රියාකාරි සැලැස්මත්, සමෘද්ධි බැංකුවල ක්‍රියාකාරකම් ඒකාබද්ධ කර බැංකු සමිති ක්‍රියාකාරි සැලැස්මත් සකස් කල යුතු අතර **මෙහි ප්‍රධානම වගකීම සමෘද්ධි බැංකු සමිති කළමණාකරු ඇතුළු කාර්ය මණ්ඩලය වෙත පැවරේ**. මෙසේ සකසා ගත් සමෘද්ධි බැංකු සමිතියේ ක්‍රියාත්මක සැලැස්මේ පිටපතක් 2022 මාර්තු 10 දිනට පෙර දිස්ත්‍රික් සමෘද්ධි අංශයට යොමු කිරිමට කටයුතු කල යුතු වේ. දිස්ත්‍රික්කයේ සියළුම සමෘද්ධි බැංකු සමිතිවල ක්‍රියාකාරි සැලැසුම් ඒකාබද්ධ කර දිස්ත්‍රික්කයේ සාරාංශ ගත ක්‍රියාකාරි සැලැස්ම සකස් කල යුතු අතර, දිස්ත්‍රික්කයේ ප්‍රගති සමාලෝචන රැස්වීම් වලදී ප්‍රගතිය සමාලෝචන සඳහා මෙම ආකෘති භාවිතා කල හැක.




1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramulla

| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන) / மேலதிக பணிப்பாளர் தலைமையதிபதி ( நிர்வாகம்/தாபனம்) / Additional Director General (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) / பணிப்பாளர் (குறு நிதி ) / Director ( Micro Finance) | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dg@samurdhi.gov.lk | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | | |
| | | **Hot Line :0112-889007** | | **Hot Line:0112-885582** | **Hot Line: 011- 2887722** |

සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිති කළමණාකරු සතියකට අවම වශයෙන් එක් දිනක් හෝ තම බල ප්‍රදේශයේ සමෘද්ධි බැංකු නිරීක්ෂණය සඳහා සහභාගි විය හැකි පරිදි තම ඉදිරි වැඩසටහන සකස් කර ගත යුතුවේ. මෙම සති නිරීක්ෂණ කටයුතු වලදි සමෘද්ධි බැංකුවේ ක්‍රියාත්මක සැලැස්ම අනුව බැංකු කටයුතු ඉටුවන්නේද විශේෂයෙන් සමෘද්ධි බැංකු පරිසනක වැඩසටහන සම්බන්ධ ප්‍රගතිය නිරීක්ෂණය කල යුතු වේ.

සමෘද්ධි බැංකු සමිතිවල ක්‍රියාත්මක සැලැස්මට අනුව කටයුතු ඉටුකිරිම හා සමෘද්ධි බැංකු සමිති පරිසනක කටයුතු පිළිබඳව නිරික්ෂණය සඳහා සමෘද්ධි බැංකු විෂයභාර දිස්ත්‍රික් කළමණාකරු සහ සුදුසු නිලධාරින් පිරිසක් දිස්ත්‍රික්කයේ සමෘද්ධි බැංකු සමිති නිරික්ෂණය සඳහා යොදා ගැනීමට යෝග්‍ය වැඩපිළිවලක් යොදා ගත යුතුවේ.

සමෘද්ධි බැංකු වලට හා බැංකු සමිති වලට අදාල ක්‍රියාකාරි සැලැස්ම සකස් කර ගැනීම පිළිබද දැනුවත් කිරිමක් Zoom තාක්ෂණය ඔස්සේ දිස්ත්‍රික්කයේ බැංකු විෂය කළමණාකරු වෙත ලබාදෙන අතර එම නිලධාරියා විසින් සමෘද්ධි බැංකු සමිති කළමණාකරුවන් මේ පිළිබඳව දැනුවත් කල යුතුය. **<u>ක්‍රියාත්මක සැලැස්මට අදාල ආකෘති දිස්ත්‍රික්කයේ විද්‍යුත් තැපැල් ලිපිනයට යොමු කර ඇත.</u>**

මෙම කටයුත්තට සමගාමීව සමෘද්ධි බැංකු, බැංකු සමිති හා දිස්ත්‍රික් මට්ටමින් ප්‍රගති සමාලෝචනයන් පැවැත්වීම පිළිබඳව විස්තරද ඔබ වෙත ඉදිරියේදි යොමු කරනු ඇත.

මෙම කරුණු පිළිබඳව යම් ගැටළුවක්වේ නම් ක්ෂුද්‍ර මූල්‍ය අංශයේ දුරකථන අංක 0112887489 හෝ 0113054528 අමතා තොරතුරු ලබාගත හැක.

ආර්.පී.බී.තිලකසිරි
අධ්‍යක්ෂ ජනරාල්.

පිටපත් -

1. අධ්‍යක්ෂ මණ්ඩල සභාපති - සමෘද්ධි ප්‍රජාමූල බැංකු මහ සංගමය - දැ.ගැ.ස
2. සියළුම සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිති හා බැංකු සභාපතිවරු, - දැ.ගැ.ස
3. ප්‍රධාන අභ්‍යන්තර විගණන , සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව, - දැ.ගැ.ස